රහසිගතයි

Ministry of Power & Renewable Energy

05 OCT 2017

Planning & Development Division

# අමාත්‍ය මණ්ඩල කාර්යාලය
# அமைச்சரவை அலுவலகம்
# OFFICE OF THE CABINET OF MINISTERS

CABINET DECISION    අමාත්‍ය මණ්ඩල තීරණය    அமைச்சரவைத் தீர்மானம்

පිටපත් : ජනාධිපති ලේකම්.    මගේ අංකය: අමප/17/2005/727/040
අග්‍රාමාත්‍ය ලේකම්.    2017 ඔක්තෝබර් මස 04 දින.
ජාතික ප්‍රතිපත්ති හා ආර්.ක. ලේකම්.
මුදල් හා ජනමාධ්‍ය ලේකම්.
ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රති.ලේකම්.
ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත.
ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත.
විගණකාධිපති.

ක්‍රියා කළ යුතු : විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්.
කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්.

06/10/17

**සූර්ය බල විදුලි ජනන ව්‍යාපෘති සඳහා වගා නොකර**
**<u>අත්හැර දමා ඇති කුඹුරු ඉඩම් ලබාගැනීම</u>**

(විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2017-08-18 දිනැති සංදේශය)

2017 සැප්තැම්බර් මස 26 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු    අ.කලේ/එස්.අබේසිංහ
අතිරේක ලේකම්.    අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

**(ආ) න්‍යාය පත්‍රයේ විෂයයන්:**

**(I) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා - සාමාන්‍ය:**

40. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 17/2005/727/040 වූ, **"සූර්ය බල විදුලි ජනන ව්‍යාපෘති සඳහා වගා නොකර අත්හැර දමා ඇති කුඹුරු ඉඩම් ලබාගැනීම"** යන මැයෙන් විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති ඇමතිතුමා ඉදිරිපත් කළ 2017-08-18 දිනැති සංදේශය - ඉහත සඳහන් සංදේශය, මුදල් හා ජනමාධ්‍ය ඇමතිතුමාගේ සහ වැඩබලන ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ ඇමතිතුමාගේ නිරීක්ෂණ සහ මෙම රැස්වීමේදී වැඩබලන විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති ඇමතිතුමා විසින් සිදු කරන ලද වැඩිදුර කරුණු පැහැදිලි කිරීම සහ කෘෂිකර්ම ඇමතිතුමා විසින් පළ කරන ලද අදහස් දැක්වීම් සමඟ සලකා බලන ලදී. මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයාගේ සහ අනෙකුත් අදාළ බලධාරීන්ගේ එකඟතාව ලබාගැනීමට යටත්ව, සූර්ය බල විදුලි ජනන ව්‍යාපෘති සඳහා බස්නාහිර සහ සබරගමුව පළාත්හි අත්හැර දමා ඇති කුඹුරු ඉඩම් භාවිත කිරීම පිණිස අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

→2

ක්‍රියා කළ යුතු:

**විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය** - ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

**කෘෂිකර්ම අමාත්‍යාංශය** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

පිටපත්:

**ජනාධිපති ලේකම්** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

**අග්‍රාමාත්‍ය ලේකම්** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

**මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය** - වැඩබලන ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ ඇමතිතුමාගේ නිරීක්ෂණ යා කොට ඇත.

**ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය** - මුදල් හා ජනමාධ්‍ය ඇමතිතුමාගේ නිරීක්ෂණ යා කොට ඇත.

**ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

**ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.